# ශ්‍රී ලංකාවේ ආගමික හා සමාජ ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී ෆාහියන් දේශාටන වාර්තාවේ උපයෝගිතාව පිළිබඳ විමසුමක්

*ආර්. එච්. එල්. දිසානායක*[1]

බෞද්ධ ධර්මදූත සේවාවේ ප්‍රතිඵලයක් ලෙස චීනයට බුදුදහම ලැබුණු අතර එය චීනය තුළ මනා සේ ව්‍යාප්ත වී ගියේ ය. කෙසේ වෙතත් චීනයේ බුදු දහම ඔප්නැංවීම සඳහා චීන භික්ෂූන් වහන්සේලා දේශාටනයේ යෙදී බෞද්ධ පොතපත සොයා ගැනීම ආදි කාර්යයන් සඳහා දායක වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස චීන සංචාරක භික්ෂුවක වූ ෆාහියන් භික්ෂූන් වහන්සේ චීනයේ සිට බුදු දහම පිළිබඳ බෞද්ධ ග්‍රන්ථ සොයා විවිධ රටවලට වැඩම කළහ. ඉන් අවසාන වරට වැඩම කළා යැයි සඳහන් වන්නේ ශ්‍රී ලංකාවටයි. ෆාහියන් විසින් තමා ගිය රටවල තොරතුරු ඇතුළත් කරමින් රචනා කළ ඔහුගේ දේශාටන වාර්තාව පැරණි ලංකාව පිළිබඳ තොරතුරු හැදෑරීමට වටිනා විදේශීය මූලාශ්‍රයකි. මෙම අධ්‍යයනය මගින් පර්යේෂණයට ලක් කෙරෙනුයේ ශ්‍රී ලංකාවේ ආගමික හා සමාජ ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී ෆාහියන් දේශාටන වාර්තාවේ උපයෝගිතාව පිළිබඳ විමසා බැලීමකි. අධ්‍යයන ක්‍රමවේදය ලෙස ෆාහියන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු හා සමගාමී ව ලංකාවේ දේශීය සාහිත්‍ය සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයවල සඳහන් වන කරුණු සමග සංසන්දනාත්මක ව මෙම අධ්‍යයනය සිදු කර තිබේ. මෙම අධ්‍යයනය මඟින් පැහැදිලි වූයේ ෆාහියන්ගේ වාර්තාවෙහි වැඩි අවධානය යොමු ව ඇත්තේ ලංකාවේ ආගමික පසුබිම හා සමාජ පසුබිම පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කිරීමට බවයි. සමස්ත අධ්‍යයනය තුළින් පෙනී යන්නේ අනුරාධපුර යුගයේ ආගමික හා සමාජ ඉතිහාසය පිළිබඳ ෆාහියන්ගේ දේශාටන වාර්තාවේ සඳහන් තොරතුරු අනෙකුත් මූලාශ්‍රයවල දක්නට ලැබෙන තොරතුරු හා සැසඳෙන බවයි. බෞද්ධ සංස්කෘතියේ ස්වරූපය පිළිබඳව හැදෑරීමේ දී ෆාහියන්ගේ වාර්තාවේ සඳහන් කරුණු සුවිශේෂ වේ. ඒ අතර භික්ෂූන්ගේ ජීවන රටාව, බෞද්ධ උත්සව, ආරාම සහ භික්ෂූන්ගේ වාසස්ථාන පිළිබඳ තොරතුරු, ජනතාවගේ සමාජය ස්වරූපය පිළිබඳ ව දක්වන තොරතුරු දෙස බලන විට එවක සමාජය තුළ යහපත් ආගමික සමාජ වටපිටාවක් පැවති බව පෙන්වා දිය හැකි ය. ෆාහියන්ගේ සමස්ත කර්තව්‍ය දෙස බලන විට වසර දෙකක් ලංකාවේ නතර වී සිටි ඔහු ලංකාව පිළිබඳ ඉතාමත් වටින තොරතුරු ඉදිරිපත් කර තිබේ. එමෙන් ම අතීතයේ සිට චීන ලංකා සබඳතා ඉතාමත් මනා සේ පැවැති බවට ද ඔහුගේ මෙම ගමන් විස්තරය සාධක වෙයි.

***ප්‍රමුඛ පද:*** ෆාහියන්, බෞද්ධ සංස්කෘතිය, චිනය, දේශාටනය

[1] ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, hirushadissanayaka2000@gmail.com